අටවන පරිච්ඡේදය

# Internet Information Service (IIS)



අප විසින් මේ වන විට Web පිටුවක් සකසන අයුරුත් එය WebBrowser එකක දර්ශණය වන ආකාරයත් ප්‍රායෝගිකව අත්දැක්කෙමු. නමුත් අප විසින් සකසනු ලබන වෙබ් අඩවියට අයත් වෙබ් පිටු ක්‍රියාත්මක වනුයේ WebServer එකකය. වෙබ් සවර් එකක ඇතුලත් කොට ඇති අප වෙබ් අඩවිය Web Browser එකක් තුල සිට වෙබ් අඩවියෙහි නම සටහන් කල පසුව එය Web Browser එකෙහි දර්ශණය වීම සාමානයෙන් සිදුවේ.

අප විසින් සකසනු ලැබූ වෙබ් අඩවියකට අයත් වෙබ් පිටු WebServer එකක ගබඩා කොට ක්‍රියාත්මක වන ආකාරය ප්‍රායෝගිකව අත්දැක ගැනීම සදහා අපගේ පරිගණකයෙහි වෙබ් සවර් මෘදුකාංගයක් ස්ථාපිත කොට ගන්නා ආකාරය පිලිබදව විමසා බලමු. ලෝකයේ මේ වන විට වඩා ජනප්‍රිය වෙබ් සවර් මෘදුකාංග ලෙස Apache හා IIS යන මෘදුකාංග වඩා ප්‍රකටය. මෙහිදී අපට Windows XP ස්ථාපිත කොට ඇති පරිගණකයෙහි IIS ස්ථාපිත කොට ගැනීම ඉතා පහසු වන අතර එය ස්ථාපිත කොට ගැනීම සදහා අපට Windows Xp ස්ථාපිත කිරීම සදහා භාවිතා කල CD එක භාවිතා කල හැකිය. IIS සේම වෙබ් සවර් මෘදුකාංගයක් ලෙස Apache යන මෘදුකාංගයද අපට භාවිතා කල

හැකි අතර ඒ සඳහා Apache.org වෙබ් අඩවියට පිවිස නොමිලේම Download කර ගැනීමේ හැකියාව අපට ලැබේ.

## IIS ස්ථාපිත කොට ගැනීම




ඔබගේ පරිගණකයෙහි Start බොත්තම තේරීමෙන් පසුව ලැබෙන Control Panel එක වෙත පිවිසීමෙන් පසුව එහි ඇති Add or Remove Programs යන්න තෝරාගැනීමෙන් අනතුරුව ඔබට ලැබෙන Add or Remove Programs කවුලුවෙන් Add/Remove Windows Components යන බොත්තම තෝරාගන්න. එවිට පහත රූපයේ දැක්වෙන ආකාරයේ කවුලුවක් ඔබ වෙත ලැබෙනු ඇත.




ඉහත ඔබට අලුතින් ලැබුනු කවුලුවෙන් Internet Information Service යන්න තෝරාගැනීමෙන් පසුව මෙම කවුලුවෙහි ඇති



Next යන බොත්තම තෝරාගැනීමෙන් පසුව පහත රූපයේ දැක්වෙන ආකාරයේ කවුලුව ඔබ වෙත දැකගත හැකිවේ. මෙහිදී Windows XP CD එක ඇතුලත් කරන ලෙස දැක්වෙනු ඇති අතර ඔබ විසින් CD එක ඇතුලත් කිරීමෙන් පසුව Internet Information Service පරිගණකයෙහි ස්ථාපිත වේ.



මෙසේ පරිගණකයෙහි ස්ථාපිත වීමෙන් පසුව ඔබගේ පරිගණකයේ Web Server එකක් ක්‍රියාත්මක වීම ආරම්භ කරනු ඇත. මෙය තහවුරු කොට ගැනීම සඳහා Internet Explorer එක වෙත ගොස් Localhost ලෙස සටහන් කරන්න. මෙසේ සටහන් කල පසුව පහත රූපයේ පරිදි WebPage එකක් දර්ශණය වනු ඇත.



මෙහි අදහස වනුයේ Internet Information Service පරිගණකයේ නිවැරදි අයුරින් ස්ථාපිත වී ඇති බවය. අපට Localhost ලෙස සටහන් කල පසුව අප විසින් සකසනු ලැබූ වෙබ් අඩවිය දර්ශණය කරගැනීම සඳහා අවශ්‍ය Internet Information Service හී Setting වෙනස් කරගන්නා ආකාරය පිලිබඳවත් Localhost ලෙස සටහන් කල පසුව දර්ශණය වූ Web page එක ලැබුනු අයුරුත් විමසා බලමු

මේ වන විට පරිගණකයෙහි c: හී intetpub ලෙස Directory එකක් සැකසී ඇති අතර මෙහි ඇති wwwroot යන Sub Directory එකෙහි localstart.asp ලෙස File එකක් ඇති බව ඔබට දැකගත හැකිය.



අප විසින් සකසනු ලැබූ Practical.html යන ගොනුව C:\inetpub\wwwroot එකට පිටපත් කොට මෙහි ඇති localstart.asp යන ගොනුව මකා දමන්න, පසුව Internet Explorer එක වෙත ගොස් localhost ලෙස සටහන් කරන්න එවිට පහත රූපයේ පරිදි දැක්වෙන අතර. මෙහිදී localstart.asp වෙබ් පිටුව නොමැති බව දක්වනු ලැබේ.






ඔබ විසින් wwwroot යටතේ ඇති iisstart.asp යන නමින් ඇති වෙබ් පිටුව මකා දමා Internet Explorer එකෙහි localhost ලෙස සටහන් කරන්න. එවිට පහත රූපයේ පරිදි තොරතුරු ඇතුලත් කවුලුවක් ඔබ වෙත ලැබෙනු ඇත.




08

මෙහි අදහස කුමක්ද?. එය තේරුම් ගැනීමට ප්‍රථම අප යමක් කොට බලමු. අපගේ wwwroot එකෙහි මීට පෙර පිටපත් කොට ගනු ලැබූ Practical.html ගොනුවෙහි නම index.htm ලෙස මාරු කරන්න(Rename). පසුව Internet Explorer එක වෙත නැවත ගොස් localhost ලෙස සටහන් කරන්න. එවිට ඔබ විසින් HTML Tag භාවිතා කොට සටහන් කරනු ලැබූ ඔබගේ පුද්ගලික තොරතුරු ඇතුලත් ඔබගේ වෙබ් පිටුව (කලින් Practical.html පිටුවෙහි ඇතුලත් කල තොරතුරු) දර්ශණය වනු ඇත.

දැන් ඔබට යමක් වැටහෙනවා වන්නට පුලුවන. IIS මගින් වෙබ් අඩවියට අයත් වෙබ් පිටු ගබඩා කොට ඇති ස්ථානය ලෙස wwwroot යන Directory එක හඳුනාගෙන ඇති බවත්, අප විසින් loaclhost ලෙස සටහන් කල පසුව මෙම wwwroot යන Directory එක ඇතුලත ඇති එක් හඳුනාගත් එක් වෙබ් පිටුවක් ආරම්භයේදී දර්ශණය වන බවත් ඔබට වැටහෙනු ඇත.

අප විසින් කිසිදු වෙනසක් wwwroot යන Directory එකෙහි ඇති වෙබ් පිටුවලට නොකලේ නම් පලමුව ක්‍රියාත්මක වනුයේ iisstart .asp යන වෙබ් පිටුවය. (මෙම වෙබ් පිටුව මගින් localstart.asp වෙබ් පිටුව දර්ශණය වන ලෙස උපදෙස් ලබාදී ඇත. මෙම localstart.asp වෙබ් පිටුව නොමැති විට එම ගොනුව නොමැති බව දැක්වූයේ එබැවිනි). iisstart .asp ගොනුව මැකූ පසුව අපට කිසිදු තොරතුරක් නොදැක්වූයේ කුමන වෙබ් පිටුව ආරම්භයේදී දැක්විය යුතුද යන තිරණය ගැනීමට IIS මෘදුකාංගයට නුපුලුවන් වූ බැවිනි.

එම wwwroot යන Directory එකට Index.htm නමින් ගොනුවක් ඇතුලත් කල පසුව එය ආරම්භක පිටුව ලෙස හඳුනා ගනු ලැබුවේ



iisstart .asp, index.htm, Defaullt.htm, Default.asp යන වෙබ් පිටු වලින් එකක් ආරම්භක පිටුව ලෙස දර්ශණය වන උපදෙස් ලබාදී ඇති බැවිනි.

වෙබ් අඩවියක් දර්ශණය කොට ගැනීමට වෙබ් අඩවියක නමක් Web Browser එකෙහි සටහන් කල පසුව මෙම වෙබ් අඩවියට අයත් එක් පිටුවක් ආරම්භයේදී දර්ශණය කරනු ලැබේ. මෙම ආරම්භක වෙබ් පිටුව නොයෙක් වෙබ් අඩවිවල නොයෙක් නම් වලින් යුතු උවද එම නාමය අප සටහන් නොකරයි. අප විසින් සටහන් කරනුයේ වෙබ් අඩවියට අයත් නම පමනි. එවිට එම වෙබ් අඩවිය ස්ථාපිත කොට ඇති Web Server එක මගින් ආරම්භයේ දර්ශණය කල යුතු වෙබ් පිටුව තීරණය කොට එය WebBrowser එක වෙත ලබාදේ.

අප localhost ලෙස සටහන් කල පසුව සිදුවනුයේද මෙම ක්‍රියාවලියමය. වෙබ් IIS ස්ථාපිත කල පසුව අපගේ පරිගණකය Web Server එකක ක්‍රියාවලිය සිදුකරනු ලබන බව ඔබට වැටහෙනු ඇත.

වෙබ් අඩවිය ස්ථාපිත කොට ඇති ස්ථානය පලමුව ආරම්භ විය යුතු වෙබ් පිටුව ආදී කාරණා IIS මගින් තීරණය කල හැකි අතර මෙම ක්‍රියාවලිය සිදුකරනු ලබන ආකාරය ප්‍රායෝගිකව අවබෝධ කොට ගනිමු.

අප විසින් Internet Information Service ස්ථාපිත කොටගත් පසුව IIS වෙත යාම සඳහා Control Panel වෙත ගොස් පසුව එහි ඇති Administrative Tools වෙත යාමෙන් පසුව ලැබෙන කවුලුවෙන් Internet Information Service යන Icon එක තේරිය

හැකිය. මෙහිදී ඔබට පහත රූපයේ පරිදි කවුලුවක් ලැබෙන අතර මෙහි ඇති කොටස් එකින් එක හඳුනා ගනිමු.



WebServer එක ක්‍රියාත්මක වීම නැවැත්වීම අපට කල හැකි අතර මේ සඳහා මෙහි Web Sites යන්නෙහි ඇති Default Web Sites යන්න තෝරා ගන්න. පසුව මෙම කවුලුවෙහි ඇති Stop යන Icon එක 

තේරීමෙන් WebServer එක ක්‍රියාත්මක වීම නැවැත්විය හැකිය. එවිට ඔබ විසින් localhost ලෙස web Browser එකෙහි සටහන් කල විට එවැන්නක් නොමැති බව දක්වනු ලැබේ. මෙහි අදහස වනුයේ IIS තාවකාලිකව webserver එකක කාර්යය සිදුනොකරන බවය.

අපට අවශ්‍ය ස්ථානයක අපගේ වෙබ් අඩවිය සඳහා ගබඩා කොට එය ක්‍රියාත්මක කිරීමටයැයි උපදෙස් දිය හැකිද?

සැබැවින්ම හැකියාව ඇත. අප විසින් IIS ස්ථාපිත කොටගත් පසුව අපට නොදැනීම C: හී intepub\wwwroot ලෙස Directory එකක් සැදී එහි ඇති iisstart.asp ගොනුව වෙබ් අඩවියේ පලමුවන පිටුව ලෙස දර්ශණය වුවත්, අප විසින් සකසනු ලැබූ සුවිශේෂී ස්ථානයක ඇති වෙබ් අඩවියක් ක්‍රියාත්මක වන ලෙස උපදෙස් ලබාදිය හැකිය. මේ සඳහා ඉහත රූපයේ පරිදි අප වෙත



ලැබුනු IIS කවුලුවෙන් Default Web Sites යන්න තෝරා Right Click කිරීමෙන් ලැබෙන Short Cut මෙනුවෙන් Property යන්න තේරීමෙන් පහත රූපයේ දැක්වෙන පරිදි කවුලුවක් ඔබ වෙත ලැබෙනු ඇත.



ඔබ විසින් මින් ඉදිරියේදී නිර්මාණය කරනු ලබන වෙබ් පිටු පරිගණකයේ වෙනමම Directory එකක ස්ථාපිත කොට ගන්න උදාහරණයක් ලෙස මා විසින් පරිගණකයේ C: හී www ලෙස Directory එකක් සකසා ගෙන ඇති අතර ඔබද එම නමින් හෝ වෙනත් නමකින් Directory එකක් සකසා එහි ඔබ විසින් කලින් සැකසූ වෙබ් පිටු ස්ථාපිත කොට ගන්න. ඉදිරියේදී සකසනු ලබන වෙබ් පිටුද මෙහිම ස්ථාපිත කොට ගත හැකිය.

08

ඉහත ඔබ වෙත ලැබුනු Default Web Site Property යන කවුලුවෙහි 

යන Tab Button එක තේරීමෙන් පසුව මෙහි A Directory located on this computer යන්න මින් තෝරාගන්න. පසුව මෙහි ඇති Local Path යන්න ඉදිරියෙහි අපගේ වෙබ් පිටු ස්ථාපිත කොට ඇති ස්ථානය හඳුන්වා

දිය හැකිය. මෙහිදී ඉහත රූපයේ c:\www ලෙස මා විසින් වෙබ් පිටු ස්ථාපිත කොට ඇති ස්ථානය හඳුන්වා දී ඇති අතර ඔබගේ වෙබ් පිටු ස්ථාපිත කොට ඇති ස්ථානය සටහන් කිරීම හෝ මෙහි ඇති Browse... බොත්තම තේරීමෙන් ලැබෙන කවුලුවෙන් හඳුන්වා දිය හැකිය. මෙහි Read යන්න මේ වන විටත් තේරී ඇති අතර මෙහි අදහස වනුයේ Web Server එක වෙත හඳුන්වා දුන් ස්ථානය හා එහි ඇති ගොනු කියවීමට පමනක් අවසර ඇති බවය. නමුත් ඇතැම් අවස්ථාවන් හීදි Web Browser එකක් හරහා Web Server එකෙහි ලිවීමේ ක්‍රියාවලියට අවසර දීම කල හැකි අතර මේ සඳහාඔබ විසින් මෙහි ඇති Right යන්න තෝරාගැනීම කල යුතුවේ. සාමාන්‍යයෙන් මෙය තෝරාගැනීම නොකරයි.

අප විසින් හඳුන්වාදුන් වෙබ් අඩවිය ස්ථාපිත කොට ඇති Directory එකෙහි iisstart .asp, index.htm, Defaullt.htm, Default.asp යන නම් වලින් වෙබ් පිටුවක් නොමැති නම් localhost ලෙස සටහන් කල පසුව කිසිවක් දර්ශණය කිරීමට අවසර නොමැති බව කියනු ලැබේ.




නමුත් ඔබ විසින් මෙහි ඇති ☐ Directory browsing යන්න තෝරාගත්තේ නම්. අප හඳුන්වාදී ඇති Directory එකෙහි ඇති Sub Directory හා ඒ තුල ඇති වෙබ් පිටු සියල්ල දර්ශණය කරනු ලැබේ. ඔබ හඳුන්වා දුන් Directory එකෙහි iisstart .asp, index.htm, Defaullt.htm, Default.asp යන නම් වලින් වෙබ් පිටුවක් ඇත්නම් එය මකා දමන්න. එසේත් නැතිනම් වෙනත් නමකට මාරු කරන්න. පසුව ඔබ විසින් localhost ලෙස Web Browser එකෙහි සටහන් කරන්න. එවිට ඔබට මීලග රූපයේ දැක්වෙන ආකාරයෙන් Sub Dirrectory ඇත්නම් ඒවාත්, හඳුන්වා





දුන් Directory එකෙහි ඇති වෙබ් පිටුද දර්ශණය වේ.




මෙහිදී වෙබ් පිටු වල නම් දර්ශණය වන අතරම මේ තුල ඇති Sub Directory වල නම් ඉදිරියෙන් <dir> ලෙසද දැක්වෙන අතර මින් වෙබ් පිටුවක් Mouse එක මගින් තෝරාගත්තේ නම් එම පිටුවෙහි අඩංගු තොරතුරු WebBrowser එකෙහි දර්ශණය වේ. 08
මෙහිදී අප විසින් <dir> ලෙසින් දැක්වෙන Sub Directory එකක් තෝරාගත්තේ නම් ඒ තුල ඇති Sub Directory හා File ඉහත රූපයේ පරිදිම දැකගත හැකිවේ. මින් අපට දර්ශණය කරගැනීමට අවශ්‍ය වෙබ් පිටුව දර්ශණය කොට ගත හැකිවේ.

## ආරම්භයේදී දර්ශණය විය යුතු වෙබ් පිටුව තීරණය කිරීම

iisstart .asp, index.htm, Defaullt.htm, Default.asp යන නම් වලින් යුතු වෙබ් පිටුවක් අප හඳුන්වා දුන් Directory එකෙහි ඇති විට එය ආරම්භයේදී දර්ශණය වන බව ඔබ මේ වන විට අවබෝධ කොට ගෙන ඇත. නමුත් ආරම්භක වෙබ් පිටුව කුමන්ද යන්න

අපට තීරණය කිරීම කල හැකිය. මේ සඳහා Default Web Site Property කවුලුවෙන් Documents යන Tab Button එක තෝරාගන්න. එවිට පහත රූපයේ දැක්වෙන ආකාරයෙන් දැක්වෙන අතර අපට ආරම්භයේ දැක්විය යුතු වෙබ් පිටුව කුමක්දැයි මෙහි ඇති Add... බොත්තම තේරීමෙන් ලබාදිය හැකිය. මෙහි ඇති Remove... බොත්තමින් මේ වන විටත් දර්ශණය වන ලෙස උපදෙස් දී ඇති වෙබ් පිටු ඉවත් කල හැකිය.




ඔබ මේ වන විට WebServer මෘදුකාංගයක් වන IIS ස්ථාපිත කොට ගන්නා ආකාරයත් එහි ඇති භාවිතයන් වඩා හොදින් අවබෝධ කොට ගත් අතර. මෙහි පහසුකම් ඔබට ප්‍රායෝගික භාවිතයෙන් අවබෝධ කොට ගත හැකිය.

සාමාන්‍යයෙන් වෙබ් පිටුවක (HTML පිටුවක) නමක් Web Browser එකක සටහන් කල පසුව දර්ශණය වන නමුත් Server Scrpting Language භාවිතා කොට සකසනු ලබන වෙබ් පිටුවක් ක්‍රියාත්මක කිරීමේදී WebServer එකක ස්ථාපිත කිරීම කල යුතු අතර එමගින් එම වෙබ් පිටු ක්‍රියාත්මක කල යුතුවේ. ඉදිරි පාඩමකදී අප විසින් හදාරණු ලබන PHP ක්‍රියාත්මක වීමට නම් WebServer එක නිවැරදිව ක්‍රියාත්මක වෙමින් පැවතිය යුතුය. ඔබ විසින් ඉදිරි පාඩම් වෙත යාමට ප්‍රථම නිවරදි අයුරින් පරිගණකයේ IIS ස්ථාපිත කොට ගන්න.